

# 11 වසර චිත්‍ර කලාව


**කේ.ඩබ්.චන්දන කුමාරසිංහ,**
**කෑ/වර/ධර්මසිරි සේනානායක මධ්‍ය මහා විද්‍යාලය,**
**තුල්හිරිය.**

**නිපුනතාවය;3.0**

- පාරිභාරික අවශ්‍යතා සඳහා නිර්මානකරණයේ යෙදෙයි.

**නිපුනතා මට්ටම;**

- නිර්මාණාත්මක සැරසිළි ඒකක භාවිතා කර භාණ්ඩ සඳහා සැරසිළි නිර්මාණය කරයි.

## ක්‍රියාකාරකම;- 3.3.3

“විදුලි මේස ලාම්පුවක් නිර්මාණය කිරීම.”

**පාරිභාරික භාණ්ඩ යනු;-**

මිනිසා විසින් එදිනෙදා පරිහරණය කරන දේවල්

**මෝස්තර ඒකකයක් නිර්මාණය කිරීමේදී  අවස්ථා 4ක් දැක්විය හැකිය.එනම්,**

1.ස්වාභාවික හැඩය ඒ අයුරින්ම යොදා ගෙන මෝස්තර ඒකකය නිර්මානය කිරීම.

2.ස්වාභාවික හැඩයෙන් කොටසක්ඉවත් කර මෝස්තර ඒකකය නිර්මානය කිරීම.

3.ඉවත් කළ හැඩයට නව හැඩතලයක්  එකතු කර මෝස්තර ඒකකය නිර්මාණය කිරීම.

4.මූලික හැඩය තබා  ගනිමින් එය නිර්මාණාත්මකව වෙනස් කර මෝස්තර ඒකකය නිර්මාණය කිරීම.


# විවිධ ලාම්පු ආවරණ






# විවිධ ලාම්පු ආවරණ








දළ සටහන් ඇඳීම.




- **දළ සටහන් ඇදීම**:-මෝස්තර ඒකකයක් නිර්මාණය කිරීම සඳහා ඒයට පසු අභ්‍යාස ලෙස තේමාවට ගැළපෙන අයුරින් දළ සටහන් ඇදීම කළ යුතුය.

ඒමගින් මෝස්තර ඒකකයක් නිර්මාණය කිරීම පහසු වේ.



සැළසුමෙහි ආකෘතිය පිළිබදවද ඔබට
යම් අවබෝධයක් ලබා ගත හැකි
නම්,ඒය වඩාත් අගනේය,



- විදුලි මේස ලාම්පුවක් නිර්මාණයේදී පහත කරුණු කෙරෙහි වඩාත් සැළකිලිමත් විය යුතුය.

ඒනම්,

සමබරතාවය,

උස සහ පළල

පෙරළන්නේ නැති ස්වාභාවය

යොදා ගන්නා මාධ්‍ය

නව්‍යය බව/නිර්මාණාත්මක බව



- විදුලි මේස ලාම්පුව ආවරනය වර්ණ ගැන්වීමේදී පෝස්ටර් වර්ණ,ඇක්‍රිලික් යන වර්ණ භාවිතා කළ හැක.වැඩි වශයෙන් ආවරණ සඳහා අමුරෙදි භාවිතා කෙරේ.කහ සහ දුඹුරු වර්ණ මේ සඳහා භාවිතා කර ඇත.ලාම්පුවේ ආධාරකය සඳහා උණ පුරුකක් යොදාගෙන ඇත.ඒහි නැවුම් වර්ණය ලාම්පුවටද අලංකාරයක් ඒක් කරයි.



- මෝස්තර ඒකකයන් ඇඳීම සඳහා ගැළපෙන අයුරින් සීමාවන් තුළ වර්ණාලේපය කළ යුතුය.



- ස්වාභාවික හැඩතලයක් ආශ්‍රයෙන් නිර්මාණය කරගත් මෝස්තර ඒකකය ඇඳ වර්ණ ගැන්විය යතුය.



- වර්ණ සමබරතාවය පවත්වා ගනිමින් යට තීරුව සහ උඩ තීරුව තුළ ඒකම වර්ණය යෙදීම මෙහිදී සිදු කර ඇත.



- වර්ණ සමබරතාවය පවත්වා ගනිමින් විදුලි ලාම්පු ආවරණය මේ ආකාරයට වර්ණ කර අවසන් කළ හැක.විවිධ ආකාරයෙන් ලාම්පු ආවරණ නිර්මාණය කළ හැක.ත්‍රිමාණ,ද්විමාණ ලෙසද වෙනත් ශෛලයක ආකාරයෙන් වර්ණ කිරීමට හැකියාව ඇත.

පැවරුම:-ශාකමය හැඩතල හෝ සත්තව හැඩතල හෝ ජ්‍යාමිතික හැඩතල හෝ භාවිතා කරමින් නිර්මාණාත්මක විදුලි මේස ලාම්පු ආවරණයක් නිර්මාණය කරන්න.

ස්තූතියි!

කේ.ඩබ්.චන්දන කුමාරසිංහ,

කෑ/වර/ධර්මසිරි සේනානායක මධ්‍ය මහා විද්‍යාලය

,තුල්හිරිය.